# CENTRE FOR MONITORING ELECTION VIOLENCE

# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

24/2, 28th Lane, Off Flower Road, Colombo 7.
**Tel: 11 4062180-190, 011 2565304, Fax: 011 4714460, 0114503001**.
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cmev.org

## ජනාධිපතිවරණය 2015

## මාධ්‍ය නිවේදන 07

**2014 දෙසැම්බර් 28 වන දින ප.ව.11.30ට.**

ජනාධිපතිවරණය සඳහා ගැසට් නිවේදනය නිකුත් කළ වර්ෂ 2014 නොවැම්බර් මස 20වන දින සිට ගත වූ කාලය තුළ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට සමස්ථ සිද්ධීන් 176ක් වාර්තා වී ඇත. ඉන් සිද්ධීන් 104ක් බරපතළ සිද්ධීන් ලෙස ද සිද්ධීන් 72ක් සුළු සිද්ධීන් ලෙස ද වර්ගීකරණය කර ඇත. වැඩිම බරපතළ සිද්ධීන් සංඛ්‍යාව දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ. මැ.ප්‍ර.නි.ම.ට වාර්තා වූ ආසන්නතම බරපතළ සිද්ධීන් පහත දක්වා ඇත.

**දෙසැම්බර් 28 වන දින නුවර දිස්ත්‍රික්කයේ ගම්පොළ දී සිදු වූ තර්ජනය කිරීම.**

ගම්පොල පිහිටි එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන කාර්යාලයට ඇතුළු වූ අග්‍රාමාත්‍ය දි.මු. ජයරත්න මහතා සහ ඔහුගේ ආධාරකරුවන් පිරිසක් එකී කාර්යාලයේ සිටි පිරිසකට ''හොඳින් නම් හොඳින්, නරකින් නම් නරකින්, මාත් බලා ගන්නම්කො'' යනුවෙන් තර්ජනයකළ බව මැ.ප්‍ර.නි.ම.ට වාර්තා විය. එම කාර්යාලය පවත්වාගෙන යන සහ තර්ජනය සිදු වන අවස්ථාවේ එම කාර්යාලයේ සිටි සමන්ත අරුණ කුමාරට අනුව අගමැතිවරයා සහ ඔහුගේ ආධාරකරුවන් පිරිස එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පැවැති රැස්වීමකින් අනතුරුව එම ස්ථානයට පැමිණ ඇත. මේ සිද්ධිය සම්බන්ධයෙන් ගම්පොල පොලීසියේ CIB(3 19/291) යටතේ පැමිණිල්ලක් ගොනු කර ඇති අතර පළිගැනීම්වලට ලක් වීමට ඇති බිය නිසා එය වැඩි දුරටත් විභාග නොකරන ලෙසට පැමිණිලිකරුවන් පොලීසියෙන් ඉල්ලා ඇත.

**දෙසැම්බර් 28 වන දින නුවර දිස්ත්‍රික්කයේ ගල්පායේ දී වාර්තා වූ පහර දීම.**

කලින් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සිට පසුව එක්සත් ජාතික පක්ෂයේ ආධාරකරුවෙකු මෙන්ම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු වන කරුණාතිලක මහතාගේ බෑණනුවන් වන රෝහණ කුමාර හට පහර දීමක් සිදු වී ඇති බවට දෙසැම්බර් 25 වන දින මැ.ප්‍ර.නි.ම.ට වාර්තා විය. රෝහණ මහතා පැවැසූ ආකාරයට ඔහු ගමන් කරමින් සිටින විට ඔහු ඉදිරිපසට පැමිණි වෑන් රථයක් ඔහුව හරස් කොට නවතා ඇත. රෝහණ මහතා එම අවස්ථාවේ කරුණාතිලක මහතාගේ වාහනය පදවමින් සිට ඇත. එම අවස්ථාවේ කරුණාතිලක මහතා වාහනයේ සිටින්නට ඇති බවට විශ්වාස කරන්නට ඇති බව රෝහණ මහතා ප්‍රකාශ කරන ලදී. මෙම සිද්ධිය සම්බන්ධයෙන් MOIB 245/216 යටතේ පොලිස් පැමිණිල්ලක් ගොනු කර ඇත.

**දෙසැම්බර් 27 වන දින ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලේ දී සිදු වූ රාජ්‍ය දේපළ අයථා පරිහරණය.**

දෙසැම්බර් 27 වන දින ස්වාධීන රූපවාහිනිය මගින් විකාශනය කළ "සූරිය ඔබයි" වැඩ සටහන සඳහා කන්තලේ සිට පුද්ගලයින් 200-300ක පමණ පිරිසක් ප්‍රවාහනය කිරීම සඳහා අංක wpMP-4979 දරන බස් රථය භාවිතා කළ බවට මැ.ප්‍ර.නි.ම.ට වාර්තා විය. මෙම වැඩසටහන එක්සත් ජනතා නිදහස් සන්ධාන ජනාධිපති අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතා වෙනුවෙන් කන්තලේ නුවර වැව ඉදිරිපිට සිට විකාශය කරන ලදී. මැතිවරණ කොමසාරිස්තුමා විසින් නිකුත් කරන ලදම "මාධ්‍ය උපමාන" උල්ලංඝණය කරමින් විකාශය කළ මෙම වැඩසටහන පිළිබඳව මැ.ප්‍ර.නි.ම. මේ වන විට මැතිවරණ කොමසාරිස්වරයා ඇතුළු අදාළ පාර්ශව වෙත පැමිණිලි කර ඇත.

**දෙසැම්බර් 26 වන දින මහනුවර දිස්ත්‍රික්කයේ මනිකිත්ත දී පක්ෂ කාර්යාලයකට පහර දීම.**

සිසිල් ජයවර්ධන මහතා විසින් පවත්වා ගෙන ගිය එක්සත් ජාතික පක්ෂ කාර්යාලයට දෙසැම්බර් මස 26 වන දින නාඳුනන පිරිසක් විසින් පහරදුන් බවට වාර්තා විය. පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාගේ දැන්වීම් පුවරු විනාශ කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් පොලිස් පැමිණිල්ලක් ERIB 81/55 අංක යටතේ සිදු කර ඇත.

**දෙසැම්බර් මස 28 වන දින අනුරාධපුර දිස්ත්‍රික්කයේ තඹුත්තේගම දී සිදු කරන ලද නීති විරෝධී මැතිවරණ ප්‍රචාරණය.**

අංක LH-1943 දරන ඩිමෝ වාහනයෙන් ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කරමින් ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපේක්ෂකයා වෙනුවෙන් පවත්වන රැස්වීමට ප්‍රචාරයක් සිදු කළ බවට මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂක වාර්තා කරන ලදී. මෙම රැස්වීම 28 වන දින සවස 4.00ට පමණ වෙහෙරගල බෞද්ධ මධ්‍යස්ථානයේ දී පැවැත්වෙන බවට ප්‍රකාශ කර ඇත. මේ සම්බන්ධයෙන් මැ.ප්‍ර.නි.ම. රාජාංගණ ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එච්.සරත් ගාමිණී මහතාගෙන් විමසූ විට එම සිදුවීම තහවුරු කරන ලදී.

**දෙසැම්බර් 28 වන දින අනුරාධපුරේ නුවරගම දී සිදු වූ නීති විරෝධී ප්‍රචාරක කටයුතු.**

ගංවතුර හේතුවෙන් අවතැන් වූ පිරිසට ජයබිම ශාලාවේ දී මහින්ද රාජපක්ෂ මහතාගේ රූව සහිත පාසල් බෑග් බෙදා දී ඇති බවට මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂක වාර්තා කරන ලදී. නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී. බන්දුලසේන මහතා මැ.ප්‍ර.නි.ම.ට ප්‍රකාශ කළේ ඔවුන් ගංවතුරෙන් අවතැන් වූ දරුවන් වෙනුවෙන් පාසල් බෑග් බෙදා දීමක් සිදු කළ ද එහි කිසිදු රූවක් මුද්‍රණය වී නොතිබූ බවයි.

**දෙසැම්බර් 27 වන දින කළුතර දිස්ත්‍රික්කයේ හොරණ දී සිදු වූ රාජ්‍ය දේපළ අයථා පරිහරණය.**

එක්සත් ජනතා නිදහස් සන්ධාන බස්නාහිර පළාත් සභා මන්ත්‍රී යසපාල කෝරළගේ විසින් හොරණ විද්‍යාරත්න විද්‍යාතනයේ දී මැතිවරණ ප්‍රචාරණ රැස්වීමක් පැවැත් වූ බවට මැ.ප්‍ර.නි.ම.ට වාර්තා විය. පෙර දිනයේ දී(27 වන දින) මැ.ප්‍ර.නි.ම.ට වාර්තා වූයේ අදාළ ස්ථානයකට පෙරහැරකින් පැමිණ රැස්වීම පැවැත්වීමට නියමිත බවයි. ඒ සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස්වරයාට සිදු කරන ලද පැමිණිල්ල හේතුවෙන් පෙරහැර අවලංගු කර රැස්වීම පමණක් පවත්වා ඇත.

**දෙසැම්බර් 28 වන දින බොරැල්ල බෞද්ධාලෝක මාවතේ දී සිදු වූ නීති විරෝධී ප්‍රචාරක කටයුතු.**

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා පහත් බිම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලයේ සේවකයින් යොදා ගත් බවට මැ.ප්‍ර.නි.ම.ට වාර්තා විය. ඔවුන් ජනාධිපති

අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතාගේ මැතිවරණ ප්‍රචාරක පත්‍ර ඉහත මාර්ගයන්හි දී බෙදා දීමක් සිදු කර ඇත.

**දෙසැම්බර් 28 වන දින කළුතර දිස්ත්‍රික්කයේ පැලවත්ත දී සිදු වූ පොලීසියේ වැරැදි සහගත ක්‍රියාකාරීත්වය.**

මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ නීති විරෝධී ප්‍රචාරක පුවරුවක් පිහිටුවීම පිළිබඳව එය පිහිට වූ ඉඩම අයිති හෙට්ටිආරච්චිගේ දොන් වීරරත්න මහතාගෙන් පැමිණිල්ලක් මැ.ප්‍ර.නි.ම.ට ලැබුණි. මෙම පුවරුව පිහිටි ඉඩම මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට අයිති යැයි පැවසූන නිසා පොලීසිය එය ඉවත් කිරීමෙන් වැලකී සිට ඇති බව ද ඒ වෙනුවට පොලීසිය විසින් අදාළ පුවරුව කලු රෙද්දකින් වසා දමා ඇති බව ද ඉඩම් හිමිකරු විසින් මැ.ප්‍ර.නි.ම.ට දන්වා ඇත.

**දෙසැම්බර් 28 වන දින ගම්පහ දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ දී වාර්තා වූ පක්ෂ කාර්යාලයට පහර දීම.**

වර්ණකුලසූරිය හෙන්රි ජෝසප් ප්‍රනාන්දු විසින් පවත්වා ගෙන ගිය එක්සත් ජාතික පක්ෂයේ කාර්යාලයට පුද්ගලයින් පිරිසක් විසින් හානි කර ඇති බවට මැ.ප්‍ර.නි.ම.ට පැමිණිල්ලක් ලැබී ඇත. අඩි 10*4 ප්‍රමාණයේ ප්‍රචාරක පුවරු 03ට හානි සිදු කර ඇති බවට ද අඩි 12ක් දිග යකඩ බට 06ක් සොරාගෙන ගොස් ඇති බවට ද තොරතුරු ලැබී ඇත. මේ සම්බන්ධව මිනුවන්ගොඩ පොලිස් ස්ථානයේ MGERIB 11 යටතේ පැමිණිල්ලක් සිදු කර ඇත.

මැ.ප්‍ර.නි.ම. වර්ෂ 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි සංධානය එක්ව ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයක් ලෙස මැතිවරණයන්හි ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණයට ස්ථාපිත කරන ලදී. වර්තමානය වන විට මැ.ප්‍ර.නි.ම. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙන් සහ මානව හිමිකම් දත්ත කේන්ද්‍රයෙන් (INFORM) සමන්විත වේ.

මැ.ප්‍ර.නි.ම. සියලු වාර්තා සහ මාධ්‍ය නිවේදන www.cmev.org වෙතින් ලබා ගත හැකිය.

ආචාර්ය පී. සරවනමුත්තු
සම කැඳවුම්කරු